# (ඉ) ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය

ග්‍රාමීය අංශයට ආයතනික ණය සැපයෙනුයේ ප්‍රධාන වශයෙන්ම ග්‍රාමීය සමුපකාර බැංකු සහ නව කෘෂිකාර්මික ණය ක්‍රමය මගිනි. මෙයට අමතර වශයෙන්, නියමිත කාර්යයන් සඳහා වූ රජයේ දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන ණය ක්‍රමවලින්, වෙළෙඳ බැංකුවලින් සහ විශේෂිත ණය ආයතන වලින් ද ග්‍රාමීය අංශයට ණය සපයනු ලැබේ.

## 1. සමුපකාර ග්‍රාමීය බැංකු

ග්‍රාමීය බැංකු සංඛ්‍යාව, ඒවායේ තැන්පතු සහ අත්තිකාරම් ත්‍රෛමාසිකව II (ඉ) 1 සංඛ්‍යා සටහනින් දැක්වෙයි. ප්‍රතිසංවිධානය කළ එක් එක් විවිධ සේවා සමුපකාර සමිතියක් සඳහාම සමුපකාර ග්‍රාමීය බැංකුව බැගින් පිහිටුවීමට රජය ගත් තීරණය හේතුකොටගෙන, ග්‍රාමීය බැංකු ජාලයෙහි සීඝ්‍ර ප්‍රසාරණයක් 1972 දී දක්නට ලැබිනි. සමාලෝචනයට භාජනව ඇති වසර තුළදී අළුතින් ග්‍රාමීය බැංකු 131 ක් පිහිටුවනු ලැබූ අතර, ඉන් 111 ක් පිහිටුවනු ලැබූයේ වසරේ මුල් කාර්තුව තුළදීය. යකඩ සේප්පු ලබා ගැනීමේ හිඟ පාඩුකමක් නිසා ඊළඟ කාර්තු දෙක තුළදී ග්‍රාමීය බැංකු ජාලයෙහි ප්‍රසාරණය හීන විය. 3 වැනි කාර්තුව අවසානයේදී ග්‍රාමීය බැංකු සංඛ්‍යාව 242 ක්ව පැවැතිණි. වෙළෙඳ බැංකු වැඩ වර්ජනය නිසා සතර වැනි කාර්තුවේදී අළුතින් ග්‍රාමීය බැංකු කිසිවක් පිහිටුවනු නොලැබීය.

1971 අවසානයේදී 60,371 ක්ව පැවැති ග්‍රාමීය බැංකු වෙතවූ ඉතුරුම් තැන්පතු ගිණුම් සංඛ්‍යාව 1972 අවසානයේදී 1,02,822 ක් දක්වා සියයට 70.3 කින් ඉහළ නැගිණ. කෙසේ වුවද, ගිණුම් සංඛ්‍යාවෙහි මෙම වැඩිවීම සිදු වූයේ වසර තුළදී ග්‍රාමීය බැංකු ජාලයෙහි ඇති වූ සීඝ්‍ර ප්‍රසාරණය හේතුකොටගෙනය. එමනිසා 1971 අවසානය තෙක් පැවැති බැංකු 111 හි තත්ත්වයේ වෙනස්වීම් වෙන් වශයෙන් දැක්වීම වඩාත් උචිත වෙයි. මෙම 'පරණ' බැංකුවල[1] ඉතුරුම් තැන්පතු ගිණුම් සංඛ්‍යාව, 1972 දී ඉකුත් වසරට වඩා 16,678 කින් වැඩිවී තිබේ. 1972 අවසානයේදී 'අළුත්' (එනම් 1972 දී පිහිටුවනු ලැබූ) ග්‍රාමීය බැංකු වෙතවූ ඉතුරුම් තැන්පතු ගිණුම් සංඛ්‍යාව 25,773 ක් විය. 1972 දී ග්‍රාමීය බැංකුවල ඉතුරුම් තැන්පතු ප්‍රමාණය 1971 අවසානයේදී පැවැති මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 5·5 කින් වැඩි විය. මෙම වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 3·8 ක් 1972 දී පිහිටුවනු ලැබූ 'අළුත්' ග්‍රාමීය බැංකුවල තබන ලද තැන්පතු වලින් යුක්ත විය. වසර තුළදී 'පරණ' බැංකු වෙතවූ ඉතුරුම් තැන්පතු වලින් වාර්තා වූයේ රුපියල් දශලක්ෂ 1·7 ක හෝ සියයට 9·9 ක මැදහත් වැඩිවීමක් පමණි. 1971 අවසානයේදී රුපියල් 285 ක්ව පැවැති ඉතුරුම් තැන්පතු වල සාමාන්‍යය 1972 මුල් කාර්තුවේදී රුපියල් 236 දක්වා පහත වැටුන අතර 1970 තුන්වැනි කාර්තුවට පසුව ඇතිවූ නව පහත් මට්ටමක් වූ රුපියල් 221 දක්වා තවදුරටත් පිරිහෙන්නට විය.

1971 අවසානයේදී 838 ක්ව පැවැති ග්‍රාමීය බැංකුවල ස්ථාවර තැන්පතු සංඛ්‍යාව 1972 අවසානයේදී 812 දක්වා පහත වැටිණි. 1972 අවසානයේදී 'පරණ' බැංකුවල ස්ථාවර තැන්පතු ගිණුම් සංඛ්‍යාව 760 ක්වූ අතර 'අළුත්' බැංකුවල එම ගිණුම් සංඛ්‍යාව 52 ක් විය. 1971 දී දක්නටවූ ස්ථාවර තැන්පතු ප්‍රමාණයෙහි පහත වැටීම 1972 මුල් කාර්තුව අවසානය තෙක් පැවතින. 1972 වසරේ දෙවැනි කාර්තුවේදී ඇතිවූ සුළු දියුණුවක් හැරුන විට එම වසර අවසානයේදී ස්ථාවර තැන්පතු ප්‍රමාණය රුපියල් 6,17,150 ක පහත් මට්ටමකට එළඹියේය. 'පරණ' බැංකු විසින් දරන්නට වූ ස්ථාවර තැන්පතු ප්‍රමාණය රුපියල් 5,58,345 ක්වූ අතර 'අළුත්' බැංකු විසින් දරනු ලැබූයේ රුපියල් 58,805 ක් පමණි. 'පරණ' බැංකු විසින් දරූ ප්‍රමාණය 1971 අවසානයේදී දරන ලද මට්ටමට වඩා සියයට 17·4 කින් අඩුවිය. 1971 අවසානයේදී රුපියල් 807 ක්ව පැවැති ස්ථාවර තැන්පතුවල සාමාන්‍යය, 1972 අවසානයේදී රුපියල් 760 දක්වා පහත වැටුනි. සමහර විට, ස්ථාවර තැන්පතුවල මෙම දුර්වල තත්ත්වයෙන් පෙන්වනුයේ ග්‍රාමීය බැංකුවල වඩා දිගු කාලච්ඡේදයක් (මාස 3 සහ ඊට වැඩි) සඳහා මුදල් තැන්පත් කිරීමේ පුරුද්ද ගම්බද ප්‍රදේශයන්හි තවමත් ප්‍රචලිත නොවීම විය හැකිය.

1. 1971 අවසානයේදී පැවති ග්‍රාමීය බැංකු 111 'පරණ' බැංකු වශයෙන්ද, 1972 දී පිහිටුවන ලද ග්‍රාමීය බැංකු 'අළුත්' බැංකු වශයෙන්ද මින් මතුවට සඳහන් වනු ඇ.ත.

## ග්‍රාමීය බැංකුවල තැන්පතු හා

ප්‍රමාණය රුපියල් වලින්

| කාර්තුව අවසානය | බැංකු ගණන | තැන්පතු ගිණුම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතුරුම් | | | ස්ථාවර | | | එකතුව | | |
| | | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය |
| 1965 මාර්තු .. | 6 | 1556 | 194,013 | 125 | 10 | 8,100 | 810 | 1566 | 202,113 | 129 |
| ජූනි . | 7 | 1925 | 305,250 | 159 | 7 | 3,682 | 526 | 1932 | 308,932 | 160 |
| සැප්තැම්බර් .. | 8 | 2597 | 504,160 | 194 | 7 | 3,734 | 533 | 2604 | 507,894 | 195 |
| දෙසැම්බර් .. | 8 | 2924 | 491,626 | 168 | 9 | 4,734 | 526 | 2933 | 496,360 | 169 |
| 1966 මාර්තු .. | 8 | 3244 | 499,462 | 154 | 9 | 8,732 | 970 | 3253 | 508,195 | 156 |
| ජූනි .. | 8 | 3519 | 525,370 | 149 | 13 | 20,586 | 1583 | 3532 | 545,956 | 155 |
| සැප්තැම්බර් .. | 11 | 3923 | 604,505 | 154 | 11 | 19,868 | 1806 | 3924 | 624,373 | 159 |
| දෙසැම්බර් .. | 13 | 4636 | 703,011 | 152 | 15 | 22,737 | 1516 | 4651 | 725,748 | 156 |
| 1967 මාර්තු .. | 14 | 5150 | 707,475 | 137 | 16 | 21,587 | 1349 | 5166 | 729,062 | 141 |
| ජූනි .. | 16 | 5971 | 821,448 | 138 | 20 | 38,952 | 1948 | 5991 | 860,400 | 144 |
| සැප්තැම්බර් .. | 20 | 6968 | 1,038,201 | 149 | 28 | 40,242 | 1437 | 6996 | 1,078,433 | 154 |
| දෙසැම්බර් .. | 27 | 8792 | 1,305,846 | 118 | 41 | 65,381 | 1595 | 8833 | 1,371,227 | 155 |
| 1968 මාර්තු .. | 30 | 10378 | 1,650,228 | 159 | 85 | 111,430 | 1310 | 10463 | 1,761,658 | 168 |
| ජූනි .. | 34 | 12137 | 2,063,947 | 170 | 137 | 161,486 | 1179 | 12274 | 2,225,433 | 181 |
| සැප්තැම්බර් .. | 39 | 14689 | 2,643,592 | 180 | 254 | 221,270 | 871 | 14943 | 2,864,862 | 192 |
| දෙසැම්බර් .. | 44 | 17359 | 3,110,576 | 179 | 287 | 222,614 | 776 | 17646 | 3,333,190 | 189 |
| 1969 මාර්තු .. | 54 | 19763 | 3,624,967 | 183 | 621 | 267,109 | 430 | 20384 | 3,892,072 | 191 |
| ජූනි .. | 57 | 22314 | 4,406,770 | 197 | 575 | 383,550 | 667 | 22889 | 4,790,320 | 209 |
| සැප්තැම්බර් .. | 64 | 25598 | 4,930,514 | 193 | 687 | 437,884 | 637 | 26285 | 5,368,398 | 204 |
| දෙසැම්බර් .. | 68 | 28626 | 5,712,893 | 199 | 724 | 460,168 | 636 | 29350 | 6,173,061 | 210 |
| 1970 මාර්තු .. | 80 | 31663 | 6,209,882 | 196 | 420 | 521,345 | 1241 | 32083 | 6,731,227 | 209 |
| ජූනි .. | 86 | 34887 | 7,104,222 | 176 | 841 | 697,101 | 829 | 35728 | 7,801,323 | 212 |
| සැප්තැම්බර් .. | 89 | 38417 | 8,255,943 | 215 | 932 | 721,352 | 774 | 39349 | 8,977,295 | 220 |
| දෙසැම්බර් .. | 90 | 49939 | 16,109,287 | 322 | 892 | 799,117 | 896 | 50831 | 16,908,405 | 333 |
| 1971 මාර්තු .. | 90 | 52273 | 14,780,578 | 283 | 911 | 826,532 | 907 | 53184 | 15,607,110 | 293 |
| ජූනි .. | 90 | 53765 | 15,509,220 | 288 | 835 | 806,178 | 965 | 54600 | 16,315,398 | 299 |
| සැප්තැම්බර් .. | 91 | 56694 | 16,380,194 | 289 | 809 | 723,171 | 894 | 57503 | 17,103,365 | 297 |
| දෙසැම්බර් .. | 111 | 60371 | 17,188,297 | 285 | 838 | 676,106 | 807 | 61209 | 17,864,403 | 292 |
| 1972 මාර්තු .. | 222 | 75991 | 17,973,907 | 236 | 796 | 640,560 | 805 | 76787 | 18,614,467 | 242 |
| ජූනි .. | 235 | 88056 | 20,584,908 | 234 | 800 | 657,614 | 822 | 88866 | 21,242,522 | 239 |
| සැප්තැම්බර් .. | 242 | 96525 | 21,927,687 | 227 | 875 | 650,798 | 744 | 97400 | 22,578,485 | 232 |
| දෙසැම්බර් .. | 242 | 102822 | 22,703,436 | 221 | 812 | 617,150 | 760 | 103634 | 23,320,586 | 225 |

II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහන

**අත්තිකාරම් 1965-1972**

| අත්තිකාරම් | | | | | | | | | මුළු තැන්පතු හා මුළු අත්තිකාරම් අතර වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෙටි කාලීන ණය | | | උකස් | | | එකතුව | | | |
| සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | |
| 572 | 489,485 | 856 | ලැ.නො. | 97,413 | — | — | 586,898 | — | – 384,785 |
| 771 | 693,621 | 900 | ලැ.නො. | 135,241 | — | — | 828,862 | — | – 519,930 |
| 1038 | 855,946 | 825 | ලැ.නො | 201,654 | — | — | 1,057,600 | — | – 549,706 |
| 1153 | 914,699 | 793 | ලැ.නො | 252,596 | — | — | 1,167,295 | — | – 670,935 |
| 1316 | 1,010,628 | 768 | ලැ.නො. | 327,737 | — | — | 1,338,365 | — | – 830,170 |
| 1433 | 1,072,293 | 748 | ලැ.නො. | 356,383 | — | — | 1,428,676 | — | – 882,720 |
| 1611 | 1,204,125 | 747 | 3659 | 390,077 | 107 | 5270 | 1,594,202 | 302 | – 969,829 |
| 1783 | 1,326,457 | 744 | 4222 | 427,129 | 101 | 6005 | 1,753,586 | 292 | –1,027,838 |
| 2037 | 1,413,639 | 694 | 4943 | 493,707 | 100 | 6980 | 1,907,346 | 273 | –1,178,284 |
| 2173 | 1,560,560 | 718 | 5348 | 532,410 | 100 | 7521 | 2,092,970 | 278 | –1,232,570 |
| 2529 | 1,815,637 | 718 | 6094 | 591,527 | 97 | 8623 | 2,407,164 | 279 | –1,328,731 |
| 2897 | 2,029,476 | 701 | 6598 | 633,213 | 96 | 9495 | 2,662,689 | 280 | –1,291,462 |
| 3336 | 2,366,359 | 709 | 7458 | 736,421 | 99 | 10794 | 3,102,780 | 287 | –1,341,122 |
| 4128 | 2,592,847 | 628 | 7571 | 766,498 | 101 | 11699 | 3,359,345 | 287 | –1,133,912 |
| 4713 | 3,105,393 | 659 | 8629 | 841,780 | 98 | 13342 | 3,947,173 | 296 | –1,082,311 |
| 5586 | 3,630,731 | 650 | 9507 | 1,085,613 | 114 | 15093 | 4,716,344 | 312 | –1,383,154 |
| 6109 | 4,161,873 | 681 | 10869 | 1,134,434 | 104 | 16978 | 5,296,307 | 312 | –1,404,235 |
| 6770 | 4,397,882 | 669 | 10844 | 1,196,139 | 110 | 17614 | 5,594,021 | 318 | – 803,701 |
| 7379 | 4,969,245 | 673 | 12462 | 1,424,498 | 114 | 19841 | 6,393,743 | 322 | –1,025,345 |
| 7893 | 5,572,281 | 706 | 14325 | 1,523,646 | 106 | 22218 | 7,095,927 | 319 | – 922,866 |
| 8506 | 6,049,587 | 711 | 16345 | 1,807,274 | 111 | 24851 | 7,856,861 | 316 | –1,125,634 |
| 8894 | 6,265,170 | 705 | 16587 | 1,820,629 | 110 | 25481 | 8,085,799 | 317 | – 284,476 |
| 9671 | 6,779,046 | 701 | 17842 | 1,945,017 | 109 | 27513 | 8,724,063 | 317 | + 253,232 |
| 10017 | 7,122,213 | 711 | 18092 | 1,980,066 | 109 | 28109 | 9,102,279 | 324 | +7,806,126 |
| 10627 | 7,505,111 | 706 | 20880 | 2,222,506 | 106 | 31507 | 9,727,617 | 309 | +5,879,493 |
| 10405 | 7,232,584 | 695 | 18517 | 1,939,600 | 105 | 28922 | 9,172,184 | 317 | +7,143,214 |
| 10929 | 7,410,959 | 678 | 20293 | 2,063,927 | 102 | 31222 | 9,474,886 | 303 | +7,628,479 |
| 10725 | 7,144,913 | 666 | 21044 | 2,171,734 | 103 | 31769 | 9,316,647 | 293 | +8,547,756 |
| 11029 | 7,136,622 | 648 | 30106 | 3,129,497 | 104 | 41115 | 10,266,119 | 250 | +8,348,348 |
| 11212 | 7,328.506 | 654 | 37899 | 4,126,482 | 109 | 49111 | 11,454,988 | 233 | +9,787,534 |
| 11447 | 8,023,384 | 701 | 52728 | 5,762,400 | 109 | 64175 | 13,785,784 | 215 | +8,792,701 |
| 11515 | 8,226.663 | 714 | 60735 | 6.958,250 | 115 | 72250 | 15.184,913 | 210 | +8,135.673 |

මූලය:— ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව.

1972, ග්‍රාමීය බැංකුවල මුළු තැන්පතු ප්‍රමාණයෙහි ඉහළ නැගීමේ උපනතියක් පෙන්වීය. 1971 අවසානයේදී රුපියල් දශලක්ෂ 17·9 ක්වූ මුළු තැන්පතු ප්‍රමාණය 1972 දී රුපියල් දශලක්ෂ 5·4 කින් හෝ සියයට 30·2 කින් වැඩිවිය. මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ 1972 අවසානයේදී වූ මුළු තැන්පතු ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 3·8 ක ප්‍රමාණයක් දරූ 'අළුත්' බැංකුය. මේ අනුව, 'පරණ' බැංකු තම මුළු තැන්පතුවල සැලකියයුතු වැඩිවීමක් වාර්තා කර නොමැත.

කෙටි කාලීන ණයවල සවරූපයෙන් ග්‍රාමීය බැංකු විසින් සපයන ලද ණය ප්‍රමාණය 1972 මුල් කාර්තුව අවසානයේදී, ආන්තික පහත වැටීමක් වාර්තා කළ අතර එම වසරේ ඊළඟ මාස 9 ය තුළදී මැදහත් වැඩිවීමක් දැක්වීය. ණය ගනුදෙනු සංඛ්‍යාව 1972 අවසානයේදී 11,515 ක්ව පැවැති අතර එය 1971 අවසානයේ ණය ගනුදෙනු සංඛ්‍යාව ඉක්මවා 790 ක වැඩිවීමක් වාර්තා කැරිණි. 1972 දී ආරම්භ කළ 'අළුත්' බැංකු 131 හි වසර අවසන් වන විට ණය ගනුදෙනු 100 ක් පමණක් තිබීම සැලකිය යුතු කරුණකි. 1972 අගදී කෙටි කාලීන ණය ප්‍රමාණයෙහි සාමාන්‍යය රු. 714 ක් විය. මෙය 1971 අගදීට වඩා සුළු වැඩිවීමකි. කෙසේ වුවද, සමාලෝචනයට භාජනය වන වර්ෂය අගදී පැවැති එම සාමාන්‍යය, ග්‍රාමීය බැංකු ක්‍රමයේ සමාරම්භයට එක් වසරකට පසුව එනම්, 1965 වර්ෂයේදී පැවති මට්ටමට වඩා බොහෝ සෙයින් පහත්ය. 1971 අවසානයේදී රුපියල් දශලක්ෂ 7·1 ක්ව පැවැති, නොබේරූ ණය ප්‍රමාණය 1972 අවසානයේදී රුපියල් දශලක්ෂ 8.2 දක්වා වැඩිවිය. 'අළුත්' බැංකු 131 හි නොබේරූ ණය ප්‍රමාණය වසර අවසානයේදී රුපියල් 49,791 ක් පමණක් විය.

1972 අවසානයේදී සියළුම ග්‍රාමීය බැංකු වල මුළු තැන්පතු ප්‍රමාණය, නොබේරූ කෙටි කාලීන මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 15·1 කින් ඉක්මවාලීය. 1972 අවසානයේදී ග්‍රාමීය බැංකු 235 ක තැන්පතු, නොබේරූ කෙටිකාලීන ණය ප්‍රමාණයට වඩා වැඩි විය.

ග්‍රාමීය බැංකු විසින් දෙන ලද ණය, කාර්යයන් අනුව වර්ග කර ඇති II (ඉ) 2 සංඛ්‍යා සටහනින්, 1972 දී නිෂ්පාදන ණය රුපියල් දශලක්ෂ 0·26 කින් පහත වැටී ඇති බැව් පෙන්නුම් කෙරේ. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ගෘහ කර්මාන්තය සඳහා දී ඇති ණය ප්‍රමාණයෙහි පහත වැටීමක් වාර්තා වී ඇති නමුදු, 1972 දී සත්ව පාලනය සඳහා දී ඇති ණයෙහි වැඩිවීමක් දක්නට විය. මෙම කාර්යය සඳහා දෙන ලද ණය 1971 දී රුපියල් 58,978 ක්ව පැවැති අතර 1972 දී එය රුපියල් 1,30,177 දක්වා වැඩි විය. මෙය සියයට 121 ක වැඩිවීමකි. ණය නිදහස් කිරීම සඳහා සපයන ලද ණය ප්‍රමාණයද 1972 දී සියයට 87·3 කින් වැඩිවිය. මෙය 1971 දී පැවැති තත්ත්වයට වඩා හාත්පසින්ම වෙනස්වූ තත්ත්වයකි. අනෙකුත් කාර්යයන් සඳහා දෙන ලද ණය වල 1971 දී පැවැති මට්ටම් වලට වඩා සැලකිය යුතු වෙනස්වීමක් වාර්තා නොවීය. ග්‍රාමීය බැංකු විසින් කාර්යයන් අනුව ණය දීමේ රටාවද බොහෝදුරට ඉකුත් වර්ෂ වල පරිද්දෙන්ම පැවතුණි.

**දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය.**

ග්‍රාමීය බැංකු වල තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණයක් II පරිශිෂ්ඨයේ 63 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

## II (ඉ) 2 වැනි සංඛ්‍යා සටහන

### කාර්යයන් අනුව ග්‍රාමීය බැංකු ණය
### (සෑම වර්ෂයකම දෙසැ. 31 වැනි දිනට)

| කාර්යය | ප්‍රමාණය රුපියල් වලින් 1971 | ප්‍රමාණය රුපියල් වලින් 1972 | මුළු මුදලින් සියයට ගණන 1971 | මුළු මුදලින් සියයට ගණන 1972 |
|---|---|---|---|---|
| නිෂ්පාදනය .. | 1,515,326 | 1,246,159 | 21·2 | 15·2 |
| එයින් | | | | |
| 1· කෘෂිකර්මාන්ත .. | 1,340,908 | 1,035,266 | 18·8 | 12·6 |
| 2· සත්ව පාලනය .. | 58,978 | 130,177 | 0·8 | 1·6 |
| 3· ගෘහ කර්මාන්ත .. | 115,440 | 80,716 | 1·6 | 1·0 |
| නිවාස .. | 2,583,646 | 2,616,245 | 36·2 | 31·8 |
| ණය නිදහස් කිරීම .. | 1,851,465 | 3,467,067 | 25·9 | 42·1 |
| වෙළඳාම .. | 401,062 | 450,795 | 5·6 | 5·5 |
| පරිභෝජනය . | 97,172 | 90,808 | 1·4 | 1·1 |
| විදුලි කරණය .. | 6,495 | 6,351 | 0·1 | 0·1 |
| අනෙකුත් .. | 689,745 | 349,238 | 9·6 | 4·2 |
| එකතුව . | 7,144,911 | 8,226,663 | 100·0 | 100·0 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව

ග්‍රාමීය බැංකු වැඩිම සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය තව දුරටත් කොළඹ වූ අතර ඊලඟට අනු පිළිවෙලින් බැංකු වැඩි සංඛ්‍යාවක් වූයේ කුරුණෑගල. ගාල්ල, කළුතර සහ මහනුවර යන දිස්ත්‍රික්ක වලය. 1972 අවසානයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකුවල මුළු තැන්පතු ප්‍රමාණය, සියළුම ග්‍රාමීය බැංකුවල මුළු තැන්පතු ප්‍රමාණයෙන් සියයට 25.4 ක් නියෝජනය කරමින් රුපියල් දශ ලක්ෂ 5.98 ක්වූ අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු මුළු තැන්පතු වලින් රුපියල් දශ ලක්ෂ 2·9 ක් හෙවත් සියයට 12·4 ක් දැරීය. ණය මෙහෙයවුම් කටයුතු සම්බන්ධයෙන්ද 1972 අවසානයේදී, නොබේරූ කෙටිකාලීන ණයෙහි විශාලම ප්‍රමාණය වූයේ කොළඹ දිස්ත්‍රික්කයේය. එම ප්‍රමාණය නොබේරූ මුළු කෙටිකාලීන ණයෙන් රුපියල් දශලක්ෂ 2·1 ක් හෝ සියයට 25·6 ක් විය. සෑම දිස්ත්‍රික්කවලම තැන්පතු ප්‍රමාණය කෙටිකාලීන ණය ප්‍රමාණය ඉක්මවීය.

ග්‍රාමීය බැංකු, උකස් කටයුතු වලදී මහජන බැංකු නියෝජිතයන් ලෙසද ක්‍රියා කරති. II (ඉ) 1 සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි, 1971 අවසානයේ 21,044 ක්ව පැවැති උකස් ගනුදෙනු සංඛ්‍යාව 1972 අවසානයේදී 60,735 ක් දක්වා වැඩිවීමෙන් පෙන්වනුයේ, වටිනා ස්වර්ණාභරණ උකසට තබා ණය ලබා ගැනීම ග්‍රාමීය පෙදෙස්වල ජනප්‍රිය වී තිබෙන බවය. කෙටිකාලීන ණය ගනුදෙනු 100 ක් පමණක් තුබූ 'අළුත්' බැංකුවල උකස් ගනුදෙනු 21,058 ක් තිබීම සැළකිල්ල යොමු වියයුතු කරුණකි. 1971 අගදී වූ උකස් සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය රුපියල් 21,71,734 සිට 1972 අගදී රුපියල් 69,58,250 දක්වා සියයට 220 කින් තියුණු ලෙස ඉහළ ගියේය. 1972 අවසානයේදී 'පරණ' බැංකු විසින් උකස් සඳහා රුපියල් 44,97,553 දක්වා මුදල් යොදවා තිබූ අතර 'අළුත්' බැංකු විසින් ඒ සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය රුපියල් 24,60,697 ක්විය. උකස් යටතේ ණය ගැනීමේ ඉහළ මට්ටම, සමහර විට, එවැනි ණය ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු වැඩ පිළිවෙල සහ සීමා කිරීම් සම්බන්ධයෙන් සාපේක්ෂිතව බලන කල වැඩි හිරිහැරයක් නොවීම නිසා වියහැකිය.

### 2. නව කෘෂිකාර්මික ණය ක්‍රමය

#### (අ) වී වගා ණය

දෙන ලද ණය ප්‍රමාණය, ණය ආපසු ලබා ගන්නා ක්‍රමය සහ ප්‍රමාණය, බෝග පාලුව නිසා කල් දිගු කළ ණය ප්‍රමාණය සහ ණය ආපසු ගෙවීම් පැහැර හැර ඇති ප්‍රමාණය II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි සාරාංශ කොට දක්වා ඇත.

## II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහන

### නව කෘෂිකාර්මික ණය ක්‍රමය — වී වගා ණය

| ශීර්ෂය | ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලින් | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ (අ) 72/73 |
| දෙන ලද ණය .. | 61·4 | 11·3 | 45·8 | 9·9 | 39·4 | 12·3 | 23·6 | 5·8 | 21·4 | 6·3 | 11·6 |
| මුළු ආපසු ගෙවීම .. | 52·5 | 9·6 | 27·8 | 8·0 | 19·7 | 8·3 | 11·5 | 4·6 | 9·8 | 1·9 | 0·6 |
| (අ) සිය කැමැත්තෙන් .. | 43·1 | 9·1 | 25·6 | 7·7 | 19·7 | 7·7 | 11·5 | 4·6 | 9·8 | 1·9 | 0·6 |
| (ආ) සහල් සලාක කූපන් වලින් .. | 9·4 | 0·5 | 2·2 | 0·3 | — | 0·6 | — | — | — | — | — |
| බෝග විනාශය නිසා දීර්ඝකිරීම· | 0·2 | — | 2·5 | 0·1 | 0·5 | — | — | — | — | — | — |
| පැහැර නොහැරීම .. | — | — | — | — | — | — | 0·2 | 0·1 | 4·9 | 4·0 | 11·0 |
| පැහැර හැරීම .. | 8·7 | 1·7 | 15·5 | 1·8 | 19·2 | 4·0 | 11·9 | 1·1 | 6·7 | 0·4 | — |

| ශීර්ෂය | දෙන ලද මුදලේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ 72/73 |
| දෙන ලද ණය .. | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |
| මුළු ආපසු ගෙවීම .. | 85·5 | 85·0 | 60·7 | 80·8 | 50·0 | 67·5 | 48·7 | 79·3 | 45·7 | 30·2 | 5·2 |
| (අ) සිය කැමැත්තෙන් .. | 70·2 | 80·5 | 55·9 | 77·8 | 50·0 | 62·6 | 48·7 | 79·3 | 45·7 | 30·2 | 5·2 |
| (ආ) සහල් සලාක කූපන් වලින් .. | 15·3 | 4·5 | 4·8 | 3·0 | — | 4·9 | — | — | — | — | — |
| බෝග විනාශය නිසා දීර්ඝකිරීම· | 0·3 | — | 5·5 | 1·0 | 1·3 | — | — | — | — | — | — |
| පැහැර නොහැරීම .. | — | — | — | — | — | — | 0·9 | 1·7 | 22·9 | 63·5 | 94·8 |
| පැහැර හැරීම .. | 14·0 | 15·0 | 33·8 | 18·2 | 48·7 | 32·5 | 50·4 | 19·0 | 31·4 | 6·3 | — |

(අ) අසම්පූර්ණ දත්තයන්.

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව·

රුපියල් දශලක්ෂ 21·4 ක්වූ 1971/72 මහ කන්නයෙහි උපයෝගී කර ගත් ණය ඉකුත් මහ කන්නයෙහි උපයෝගී කර ගත් රුපියල් දශලක්ෂ 23.6 ක ණය මට්ටමෙන් රුපියල් දශලක්ෂ 2·2 ක හෝ සියයට 9·3 ක අඩුවීමක් වාර්තා කැරිණි. රුපියල් දශ ලක්ෂ 6·3 ක් වූ 1972 යල කන්නයෙහි උපයෝගී කරගත් ණය ප්‍රමාණය ඉකුත් යල කන්නයෙහි උපයෝගී කර ගත් ණය ප්‍රමාණයට වඩා සුළු වශයෙන් වැඩිවීමකි. ණය ක්‍රමය ආරම්භයේදී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 61·4 ක් සහ රුපියල් දශලක්ෂ 11·3 ක්ව පැවැති 1967/68 මහ කන්නයේ සහ 1968 යල කන්නයේ උපයෝගී කර ගත් ණය මට්ටම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 21·4 සහ රුපියල් දශලක්ෂ 6·3 දක්වා 1971/72 මහ කන්නයේදී හා 1972 යල කන්නයේදී පහත වැටී ඇත. හේතුවක් වශයෙන්, පොදුවේ දක්වෙන ණය පැහැර හැරීම් අධිකවීම නිසා, ණය උපයෝගී කර ගැනීම පිළිබඳව දක්නට වූ පිරිහීමේ උපනතිය තව දුරටත් පවතින්නට ඉඩ ඇත්තේ නැවත ණය ලබා ගැනීමට නුසුදුස්සන් වන ණය පැහැර හරින්නන්ගේ සංඛ්‍යාව වැඩි වන විට, ණය සඳහා හිමිකම් පාන අයගේ සංඛ්‍යාව අඩුවන හෙයිනි.

ආපසු ගෙවීම් සම්බන්ධයෙන්, 1969/70 මහ කන්නයේදී සියයට 50·0 සහ 1970/71 මහ කන්නයේදී සියයට 48·7 ක්වූ ආපසු ගෙවීම් හා සසඳ බලන කළ 1971/72 මහ කන්නයේ ණය වලින් ආපසු ගෙවා ඇත්තේ සියයට 45·7 කි. මෙකී ආපසු ලබා ගැනීම් ප්‍රමාණයන්, 1967/68 සහ 1968/69 මහ කන්නයන්හිදී පිළිවෙලින් සියයට 85·5 ක් හා සියයට 60·7 ක්වූ ආපසු ලබා ගැනීම් ප්‍රමාණයකට වඩා බෙහෙවින් අඩුය. 1970 යල කන්නයේදී සියයට 67·5 ක් සහ 1971 යල කන්නයේදී සියයට 79.3 ක්වූ ආපසු ගෙවීම් සමග සසඳ බලන කළ 1972 යල කන්නයේදී උපයෝගී කර ගත් ණය මුදල් වලින් ආපසු ගෙවා ඇත්තේ සියයට 30·2 ක් පමණි.

පිළිවෙලින් සියයට 85·0 ක් හා සියයට 80 8 ක්වූ 1968 සහ 1969 යල කන්නයන්හි ආපසු ගෙවීම් මට්ටමද ඊට පසුව යෙදුන යල කන්නයන් හා සැසඳූ විට සාපේක්ෂක වශයෙන් අධිකය. යල කන්නයේ ණය මුදල් අය කර ගැනීම සාමාන්‍යයෙන් ඊලඟ වර්ෂය දක්වා දිවෙයි. මීට අමතර වශයෙන් 1972 දී බැංකු වැඩ වර්ජනයද ණය ආපසු අය කර ගැනීමේ ප්‍රමාණය කෙරෙහි බලපා ඇත. දක්වා ඇති කාලච්ඡේදයන්හි ආපසු ගෙවීම් වල ඉහළ මට්ටම් කෙරෙහි, ණය ලබාගත් කුටුම්භයන්හි සහල් සලාක පොත් පවරා ගැනීම මගින් ණය ආපසු ලබා ගැනීම සීමිත ප්‍රමාණයකට බලපා ඇත.

කෙසේ වුවද, ණය උපයෝගී කර ගැනීමේ පිරිහීම් උපනතිය ආපසු ගෙවීම් වල පහත මට්ටමක් සමග යෙදෙන්නක් බව පැහැදිලි කරුණකි. ණය පැහැර හැරීම් ප්‍රමාණය තවදුරටත් ඉහළ යන්නට විය. 1967/68 මහ කන්නයේදී සියයට 14·0 ක්වූ මෙම අනුපාතිකය 1970/71 මහ කන්නයේදී සියයට 50·4 දක්වා වැඩි වූ අතර එය 1969/70 මහ කන්නයේදී සියයට 48·7 ක් වී ඇත.

**දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය**

1971/72 මහ කන්නයේ සහ 1972 යල කන්නයේ වී වගා ණය සම්බන්ධයෙන්, ණය උපයෝගී කර ගැනීම් වල හා ආපසු ලබා ගැනීම් වල තත්ත්වය, දිස්ත්‍රික්ක අනුව II පරිශිෂ්ඨයේ 64 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි. 1971/72 මහ කන්නයේදී ගාල්ල, මන්නාරම, වවුනියාව, අම්පාරේ, කුරුණෑගල, නුවරඑළිය, බදුල්ල සහ රත්නපුරය යන දිස්ත්‍රික්කයන්හි හැර අනෙකුත් සියළුම දිස්ත්‍රික්කයන්හි ණය උපයෝගී කර ගැනීමේ මට්ටම් පහත වැටිණි. 1972 යල කන්නයේදී, මාතර, අම්පාරේ, කුරුණෑගල, ගාල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය මොනරාගල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි ණය උපයෝගී කර ගැනීමේ වැඩිවීම් දක්නට වූ අතර අනෙකුත් දිස්ත්‍රික්කයන් උපයෝගී කර ගෙන ඇත්තේ ඉකුත් යල, කන්නයට වඩා අඩු ප්‍රමාණයන්ය. 1971/72 මහ කන්නයේදී බදුල්ල, පොළොන්නරුව,

## II (ඉ) 4 වැනි සංඛ්‍යා සටහන

### නව කෘෂිකාර්මික ණය ක්‍රමය - අතිරේක බෝග වගා ණය

| වර්ෂය | දෙන ලද මුදල රුපියල් සිය ගණනින් | | | | | සියළුම බෝග පිළිබඳ ආපසු ගෙවීම් තත්ත්වය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | දෙන ලද මුදලේ ප්‍රතිශතයක් වශයෙන් | | | |
| | මිරිස් | රතුළූනු | අර්තාපල් | එළවළු | එකතුව | මුළු ආපසු ගෙවීම් රු. '00 | බෝග විනාශය නිසා දීර්ඝ කිරීම් රු. '00 | පැහැර නොහැරීම් රු. '00 | පැහැර හැරීම් රු. '00 | මුළු ආපසු ගෙවීම් | බෝග විනාශය නිසා දීර්ඝ කිරීම් | පැහැර නොහැරීම් | පැහැර හැරීම් |
| 1967/68 | 19,602 | 19,843 | 11,444 | 4,138 | 55,027 | 45,533 | — | — | 9,494 | 82·74 | — | — | 17·25 |
| 1968/69 | 20,430 | 24,704<br>50* | 15,021 | 4,347 | 64,552 | 52,120 | 3,115 | — | 9,317 | 80·74 | 4·82 | — | 14·43 |
| 1969/70 | 23,933 | 29,994 | 18,333 | 3,394<br>56** | 75,710 | 54,595 | 74 | — | 21,041 | 72·11 | 0·09 | — | 27·79 |
| 1970/71 | 11,500 | 16,077 | 22,367 | 1,485<br>73** | 51,502 | 36,167 | 350 | 74 | 14,911 | 70·22 | 0·67 | 0·14 | 28·95 |
| 1971/72 | 7,020 | 14,684 | 24,496 | 2,104 | 48,304 | 21,074 | — | 25,961 | 1,269 | 43·62 | — | 53·74 | 2·62 |
| 1972/73 | 9,126 | 2,921 | 9,290 | 172<br>80** | 21,589 | 25 | — | 21,564 | — | 0·11 | — | 99·88 | — |
| එකතුව | 91,611 | 108,273 | 100,951 | 15,849 | 316,684 | 209,514 | 3,539 | 47,599 | 56,032 | 66·15 | 11·11 | 15·03 | 17·69 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

* බෝම්බයි ළූනු
** රටකජු සහ ඉරිඟු

කෑගල්ල, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි පිළිවෙලින් සියයට 82·5, 81·0, 80·8, 78·3 සහ 78·3 ක්වූ ඉහළම ආපසු ලබාගැනීම් මට්ටම් වාර්තාවී ඇති අතර, යාපනය, නුවරඑළිය, පුත්තලම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි පිළිවෙලින් සියයට 2·1, 16·7, 19·4 සහ 20·7 ක පහත්ම ආපසු ලබා ගැනීමේ මට්ටම් වාර්තා වී ඇත. ඉහත සඳහන් කළ පරිදි ණය ආපසු අයකර ගැනීම කෙරෙහි බැංකු වැඩ වර්ජනය අහිතකර ලෙස බලපා ඇත.[1] ණය ආපසු ලබා ගතයුතු කාලච්ඡේදය මේ තෙක් ඉක්ම ගොස් නැති හෙයින්, සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි 1972 යල කන්නයේ ආපසු ලබා ගැනීම් මට්ටමෙහි ක්‍රියාකාරීත්වය තීරණාත්මක වශයෙන් සැලකිය නොහැකිය.

**(ආ) අතිරේක බෝග වගා ණය**

ණය ක්‍රමය ආරම්භ කිරීමෙන් පසුව අතිරේක බෝග වගාව සම්බන්ධයෙන්, බෝග අනුව දෙන ලද ණය ප්‍රමාණය සහ ආපසු ලබා ගැනීම් මට්ටම් II (ඉ) 4 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

මිරිස්, රතුළූනු, අර්තාපල් සහ එළවළු වගාව සඳහා 1970/71 දී දෙන ලද රුපියල් දශලක්ෂ 5.1 ක ණය ප්‍රමාණය 1971/72 දී රුපියල් දශලක්ෂ 4.8 දක්වා තවදුරටත් අඩුවිණි. ණය උපයෝගී කර ගැනීමේ සටහන් වූ ඉහළ නැගෙන උපනතිය, 1969/70 තුළ රුපියල් දශලක්ෂ 7·6 ක මුදුන් මට්ටටක් කරා එළඹියේය. ඉන්පසුව ණය උපයෝගී කර ගැනීමෙහි දිගින් දිගටම ඇති වූ පිරිහීමට හේතුව වශයෙන් මේ ද්‍රව්‍ය වගා කරන්නන් විසින් වැඩි ආදායමක් ලබාගැනීම දැක්විය හැකිය. කෙසේ වුවද, අර්තාපල් වගාව සඳහා වූ ණය නොකඩවාම ඉහළ ගොස් ඇත. මෙම කාර්යය සඳහා 1971/72 දී දෙන ලද රුපියල් දශලක්ෂ 2·4 ක ණය ප්‍රමාණය 1967/68 දී දෙන ලද අනුරූප ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 1·3 ක හෙවත් සියයට 118 ක වැඩිවීමකි. ණය ආපසු ගෙවීම් ප්‍රතිශතය වසරක් පාසා පහත වැටී ඇත. 1967/68 දී සියයට 82·74 ක්වූ සියළුම ණයවල ආපසු ලබාගැනීම් මට්ටම 1970/71 දී 70·22 දක්වා පහත වැටී තිබේ. ණය වලින් සියයට 53·74 ක් පැහැර හැර නොමැති ණය සේ මේ තාක්ම වර්ග කර ඇති හෙයින්, 1971/72 දී ලබා ගත් සියයට 43·62 ක ආපසු ලබා ගැනීම් මට්ටම නියම තත්ත්වය හෙළි කරන්නක් නොවේ. 1971/72 දී අතිරේක බෝග වගාවන් සඳහා වූ ණය පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය II පරිශිෂ්ඨයේ 65 සංඛ්‍යා සටහනින් දැක්වෙයි. මඩකලපු දිස්ත්‍රික්කයේ මිරිස් සඳහා ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් සියයට 71 ක්වූ ආපසු ගෙවීම 1971/72 දී ලබා ඇති ඉහළම මට්ටම විය. අනෙකුත් සියළුම දිස්ත්‍රික්ක වල ආපසු ගෙවීම් මට්ටම් දුර්වලය. රතුළූනු සඳහා වූ ණය වල ආපසු ගෙවීම් තත්ත්වයද පහත් මට්ටම් වල පැවැතුන අතර[1] සියයට 45 ක්වූ ඉහළම ආපසු ලබා ගැනීම් මට්ටම වාර්තා වූයේ මොනරාගල දිස්ත්‍රික්කයෙනි. කෙසේ වුවද, අර්තාපල් සඳහා වූ ණය ආපසු ලබා ගැනීම් මට්ටම බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි සියයට 92·7 ක සාමාන්‍යයක පැවැති අතර එය සැලකිය යුතු තරම් වැඩි ප්‍රමාණයක් විය.

---

1· ණය ආපසු අයකර ගැනීම පිළිබඳව මෙහි සඳහන් කර ඇති දත්තයන්, මහජන බැංකුවේ පොත් වල වාර්තා වී ඇති පරිදි බව සටහන් කර ගතයුතුය. කෙසේ වුවද, සමහර වගාකරුවන් ඔවුන් ලබා ගත් ණය මුදල් සමුපකාර සමිති වලට ආපසු ගෙවා තිබීමට ඉඩ ඇතත් එම ආපසු ගෙවීම් බැංකු වැඩ වර්ජනය නිසා මහජන බැංකුවේ පොත් වල සටහන් වී නොමැත.